# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. : RG/MBD/විවිධ/පොදු-8

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. : 565

ඔබේ අංකය / உமது இல. / Your No. :

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date : 2022.08. 01


චක්‍රලේඛ අංක - 18/2021 (I)

ප්‍රාදේශීය ලේකම් /දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් මඟින්
සියලුම අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත

<u>විදේශීය ජාතිකයින් හා ශ්‍රී ලාංකිකයින් අතර විවාහ ලියාපදිංචි කිරීම</u>

ඉහත කරුණට අදාලව 2021.10.18 දිනැති ව නිකුත් කරන ලද අංක 18/2021 දරණ චක්‍රලේඛය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට තීරණය කර ඇති බව කාරුණිකව දන්වමි.

02. අදාළ චක්‍රලේඛයේ 02 වන වගන්තියේ සඳහන් "අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් මඟින් පමණක්" එවැනි විවාහ ලියාපදිංචි කිරීමට ගෙන ඇති තීරණය, විවාහ පාර්ශවකරුවන්ගේ කැමැත්ත පරිදි "අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් මඟින් හෝ කොට්ඨාස රෙජිස්ට්‍රාර්වරුන් මඟින් හෝ ලියාපදිංචි කිරීමට හැකිවන පරිදි" සංශෝධනය කරනු ලැබේ.

03. එම චක්‍රලේඛයේ 3 වන වගන්තියේ සඳහන් "විවාහ ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රය" ලද පසුව කොට්ඨාස රෙජිස්ට්‍රාර්වරුන්ටද විවාහ දැන්වීම (බී 100) භාර ගෙන ඉදිරි කටයුතු කරගෙන යාමට හැකියාව ලැබේ.

04. කොට්ඨාස රෙජිස්ට්‍රාර්වරුන් විසින් මෙවැනි ගණයේ විවාහ සම්බන්ධව දෙපාර්තමේන්තුව සමඟ සිදු කරන සියලු සම්බන්ධීකරණ කටයුතු තමා අයත් වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් මඟින් පමණක් සිදු කළ යුතු වේ.

05. මුල් චක්‍රලේඛයේ අංක 3 හා 5 වන වගන්තිවල සඳහන් පහත ලේඛන පිටපත් 4කින් යුක්තව ප්‍රධාන කාර්යාලයේ සිවිල් ලියාපදිංචි කිරීමේ අංශය වෙත යොමු කළ යුතු බවට පාර්ශවකරුවන් දැනුවත් කළ යුතු වේ.

i. ඉල්ලීම් ලිපිය
ii. වරදකට වරදකරුවකු නොවන බවට වන සහතිකය
iii. විදේශීය ජාතිකයාගේ විදේශ ගමන් බලපත්‍රයේ පිටපත
iv. දේශීය පාර්ශවකරුගේ ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රයේ පිටපත
v. සිවිල් තත්ත්වය සනාථ කිරීමේ සහතිකය

06. මුල් චක්‍රලේඛයේ 5 (II) වන වගන්තිය යටතේ සඳහන් සිවිල් තත්ත්වය සනාථ කිරීමේ ලේඛණයක් ලෙස දික්කසාද තීන්දුවක් ඉදිරිපත් කරන අවස්ථාවකදී එකී දික්කසාද තීන්දුව ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද විවාහයක් සම්බන්ධයෙන් විදේශ අධිකරණයක් විසින් නිකුත් කර ඇති අවස්ථාවකදී ඒ සම්බන්ධයෙන් මාගේ අංක RG/MBD/1/8 හා 2019.12.24 දිනැති ලිපියේ උපදෙස් බලපැවැත්වෙන බව සැළකිය යුතුය.

07. විවාහය ලියාපදිංචි කරනු ලබන කොට්ඨාස රෙජිස්ට්‍රාර්වරයා විසින් මෙම ගණයට අයත් විවාහයක් ලියාපදිංචි කළ වහාම එම විවාහයේ ස්ත්‍රී පුරුෂ දෙදෙනා සම්බන්ධ වාර්තාවක් පහත සඳහන් ශීර්ෂයන් යටතේ සකස් කර අදාල අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙත යැවිය යුතුය.

- විවාහ දැන්වීම් අංකය හා භාරගත් දිනය
- විවාහ ලියාපදිංචි සහතිකයේ අංකය හා දිනය
- සම්පූර්ණ නම
- ජාතික හැඳුනුම්පත් අංකය හා නිකුත් කළ දිනය
- විදේශියකු නම් පදිංචි රට
- විදේශ ගමන් බලපත්‍ර අංකය හා නිකුත් කළ රට
- වයස
- සිවිල් තත්ත්වය
- රැකියාව

08. මුල් චක්‍රලේඛයේ 07 වන වගන්තිය මෙයින් අවලංගු කරනු ලැබේ.

09. අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් හා කොට්ඨාස රෙජිස්ට්‍රාර්වරුන් විසින් නිකුත් කරනු ලබන "රෙජිස්ට්‍රාර්වරයාගේ සහතික පත්‍රය (බී103)" මත මෙවැනි විවාහ දේවස්ථාන වලදී වාරිත්‍රානුකූලව සිදු කිරීමට බාධාවක් නොමැති අතර ඒ අනුව මුල් චක්‍රලේඛයේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

10. අංක 18/2021 දරණ මුල් චක්‍රලේඛයේ සඳහන් අනෙකුත් සියලු කරුණු නොවෙනස්ව බලපැවැත්වේ.

11. මෙම චක්‍රලේඛය 2022.08.01 වන දින සිට ක්‍රියාත්මක වේ.

12. කරුණාකර මෙම චක්‍රලේඛය ලද බව මා වෙත දන්වන්න.

පී.එස්.පී අබේවර්ධන
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්:

1. ලේකම් රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස
2. ලේකම් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස
3. පාලක ජනරාල් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස
4. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - කා.දැ.ගැ.ස

[redacted] දෙපාර්තමේන්තුවේ සියළුම විධායක/මාණ්ඩලික නිලධාරීන් - කා.දැ.ගැ.ස

6. උප්පැන්න මරණ විවාහ රෙජිස්ට්‍රාර්වරුන් - කා.දැ.ගැ.ස